ගලගමගේ, පි.
PAPER

වැදි සංස්කෘතිය වෙනස්වීම පිළිබඳ අධ්‍යයනයක් දිඹුලාගල, දළුකාන ප්‍රදේශය ඇසුරින්

පි. ගලගමගේල

දිඹුලාගල ප්‍රදේශය දිගු ඉතිහාසයක සිට වැදි ජනයා වාසය කළ භූමියක් ලෙස හැඳින ගත හැක. අද දින ද වැදි ජනයාගෙන් පැවතෙන ප්‍රජාවන් මෙම ප්‍රදේශය තුළ ජීවත් වන අතර ඔවුන් සිය මුතුන් මිත්තන්ගේ මූලයන් පිළිබඳ මතකයන් හා ඔවුන් සමඟවන ඓන්ද්‍රීය බැඳීම් අමතක කර හා අති සීඝ්‍රයෙන් අමතකකර දමමින් පවතිනු හැඳිනගත හැක. මේ හා සම්බන්ධ වන අනෙක් කාරණය වන්නේ සිය පොදු ඇරඹුම පිළිබඳ මිත්‍යාවන් ද ඔවුන් දැනටමත් අමතක කර දමා ඇති බවයි. විශේෂයෙන්ම ඔවුන්ගේ තරුණ පරම්පරාව එකී මූලයන් වෙත සම්ප්‍රේෂණය වනු දැකගත නොහැක. මෙම තත්ත්වය සිය අනන්‍යතාව තුළ තවමත් ගොනුවී සිටින දඹාන, හෙන්නානිගල හා රතුගල ආදී ප්‍රදේශවල ආදිවාසී ප්‍රජාවන්ගේ සමාජයීය චර්යයාවට වඩා වෙනස් වේ.

මේ මගින් අපවෙත හමුවන එක් ගැටළුවක් වන්නේ මෙම ප්‍රජාවන්ගේ ජනවාර්ගික අනන්‍යතාව කුමන හැඩයකට පරිවර්තනය වනු ඇත් ද යන්නයි. මන්ද ඔවුන් සිංහල ජනවාර්ගිකත්වය සමඟ මෙන් ම එතරම් ඉහළ ප්‍රතිශතයකින් නොවූවද දෙමළ ජනවාර්ගිකත්වය සමඟද මිශ්‍රිතව හා තව දුරටත් මුසු වෙමින් පවතින බැවිණි. මේ නිසා පූර්ණ සිංහල අනන්‍යතාව තුළට ඇතුළුවීමට ඔවුන් වෙත ඉඩකඩක් විවරවේද, එසේ නොමැති නම් ඔවුන් පෙර සේ ම ආන්තික කණ්ඩායමක් ලෙස සමාජයීය පර්යන්තය නියෝජනයට හැඩ ගැසේද යන්න ගැටළුවක් ලෙස පැන නැංවේ.

දළුකාන, දඹාන, හෙන්නානිගල හා රතුගල යන වැදි ජන ජනාවාස අධ්‍යයන ප්‍රදේශ ලෙස යොදාගත් මෙම අධ්‍යයනය සඳහා සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්ණාවලීන් යන පර්යේෂන ශිල්පක්‍රම භාවිතා කොට ඇත. විශේෂයෙන් දළුකාන ප්‍රදේශය අනෙකුත් ප්‍රදේශ සමඟ සංසන්දනාත්මකව විශ්ලේෂනය කොට ඇත. පර්යේෂණයට අදාල මූලික දැණුවත්වීම් සඳහා විෂයය ක්ෂේත්‍රය හා සමගාමී සාහිත්‍ය පරිශීලනය කර ඇත.

අධිපති සංස්කෘතීන් සිය බල අභ්‍යාසයන් හරහා ආන්තික ජන කණ්ඩායම් විකරණයන්ට ලක් කරනු ලබන අතර ම ඔවුන් වෙත දරිද්‍රතාවය ද ඒ සමඟ ම අධිපති සංස්කෘතීන් විසින් හිමිකර දී ඇති බව මෙම පර්යේෂණය තුළ දී ගම්‍යමාන වන එක් කාරණයකි. එසේ ම සිංහල - ආදිවාසී හෝ දෙමළ - ආදිවාසී මිශ්‍ර විවාහ යනු එකී කණ්ඩායම්වල ද සමාජයීය පතුල නියෝජනය කරනු ලබන කොටස් අතර වන විවාහයන් ලෙස හැඳිනගත හැක. එසේ ම මෙම පිරිස් අතරින් සමහර පුද්ගලයින් ඍජු ලෙස ම සිංහල හෝ දෙමළ ජනවාර්ගිකත්වය නියෝජනය කරන්නේ ද යන්න ද තවත් පැණයකි.

මෙම කාරණා විසින් සිංහල බව, දෙමළ බව හා වැදි බව පිළිබඳ අධිපති සංස්කෘතික කතිකාවන් ප්‍රශ්නයට බඳුන් කරන අතර අප විසින් නිර්මාණය කර ගෙන ඇති දෘඩතර ජනවාර්ගික බෙදුම් රේඛාවන් ද දුරාතීතයට අයත් ඒවා නොව යටත් විජිත හා පශ්චාත් යටත් විජිත නිමවුම් බවට ඉඟියක් මේ තුළ සපයයි. එසේ ම ජේම්ස් බ්‍රෝ, ගණනාත් ඔබේසේකර ආදී පර්යේෂකයන් දක්වන මුල් කාලීන ව සිදුවූ වැදි බව සිංහලකරණයට ලක්වීමට වඩා වෙනස් බලය අභ්‍යාසකරණයක් පසු කාලීන ”වැදි බව හීලෑකරණයේදී” සිදුව ඇති බව ද දළුකාන කේන්ද්‍රිත අධ්‍යයනයන් සාක්ෂි සපයයි. ගෝත්‍රික ප්‍රජාවන් ශිෂ්ටාචාර ගත වීමේ දී ඔවුන් සමාජයීය පර්යන්තය මත ස්ථාපිත වේ ය යන්න වැදි ජනයා මගහැර ගිය බව පූර්ව ධනවාදී සමාජය සම්බන්ධ ව නිවැරදිය. ධනවාදී සමාජ පර්යාය තුළ දී සිඳුවන වැදි බව වියැකීම පිළිබඳ නිවැරදි නිරීක්ෂණය වන්නේ කුල ස්ථරායනය තුල ස්ථාන ගතවන මට්ටම කෙසේ වෙතත් පංතිමය ස්ථරායනයේ දී ඔවුන් සමාජයීය පතුල වෙත ස්ථාපිත වන බවයි.